# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013

ජනවාරි - 2017

## BMGT E3015 - උපායශීලී කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

## <u>ලංකා චැනල්ස් සමාගම</u>

ලංකා මාධ්‍ය සමාගම, 1998 වසරේදී පිහිට වූ විද්‍යුත් මාධ්‍ය ආයතනයක් වන අතර, වර්තමානය වන විට එය ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය තුල ප්‍රමුඛ ආයතනයක් බවට පත් වී ඇත. පසුගිය වසරේ ලංකා සමාගම් සමූහයේ වාර්ෂික පිරිවැටුම රු. බි. 12 ක් වූ අතර, බදු ගෙවූ පසු ලාභය රු. බි. 9 ක් ලෙස වාර්තා විය. එය පසුගිය වසරට සාපේක්ෂව 24% ක වර්ධනයක් ලෙස දැක්වේ. ලංකා සමාගම ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොල තුල ලැයිස්තුගත සමාගමක් වන අතර, එහි කොටස් වල වර්තමාන වෙළඳපල අගය, අනෙකුත් තරඟකාරී සංවිධාන වලට වඩා 30% කට වැඩි අගයක් ගෙන ඇත.

ලංකා චැනල් සමාගම මුලින්ම ආරම්භ වූයේ, ලංකා එෆ්. එම්. ගුවන් විදුලි සේවාව ආරම්භ කරමිනි. එහි සාර්ථකත්වය හමුවේ, නීලම් නමින් දෙමළ භාෂාවෙන්ද, යූත්. එෆ්. එම්. නමින් ඉංග්‍රීසි භාෂාවෙන් තවත් ගුවන් විදුලි නාලිකා දෙකක් ආරම්භ කරන ලදී.

2004 වන විට ලංකා ගුවන් විදුලි සමාගම, ශ්‍රී ලංකාවේ එෆ්. එම් ගුවන් විදුලි සේවාවන් අතර, ප්‍රමුඛ ස්ථානයකට පත් විය. මෙවැනි වර්ධනයක් සඳහා හේතුවූයේ, ගුවන් විදුලි සමාගම හඳුන්වා දුන් විවිධ නවෝත්පාදන වැඩසටහන්ය. ඒ අනුව, සාම්ප්‍රදායික ගුවන්විදුලි මාධ්‍ය භාවිතයෙන් වෙනස්ව, විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළේය. මේ සඳහා උදාහරණ ලෙස, දිවා කාලයේ ආයතනවලට ගොස් සජීවී වැඩසටහන් පැවැත්වීම, ඉහළ වටිනාකමකින් යුතු ත්‍යාග පිරිනමන තරඟ පැවැත්වීම, ශ්‍රාවකයින් සෘජුව සම්බන්ධ කරන වැඩසටහන් පැවැත්වීම ආදිය දැක්විය හැකිය. මීට අමතරව, තරඟකරුවන්ට වඩා විශාල ප්‍රමාණයක වෙනස් වූ වැඩසටහන් ලංකා ගුවන් විදුලි සමාගම තුල ක්‍රියාත්මක කළේය. මේ

සම්බන්ධයෙන් කළමනාකරණයේ දර්ශනය වූයේ සමාගම කැමති වැඩසටහන් නොව, ප්‍රේක්ෂකයා කැමති වැඩසටහන් ලබාදීම යන්නයි.

ඉහත තත්ත්වය නිසා 2005 වසරේදී, ලංකා ගුවන්විදුලි සමාගම රටේ ප්‍රමුඛ ගුවන් විදුලි සමාගමක් බවට පත්විය. ඒ අනුව, සමාගමේ කළමනාකරණය තීරණය කළේ, සමාගම රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා ද අවතීරණ විය යුතුය යන්නයි. ඒ අනුව 2006 වසරේදී, ලංකා ටී. වී. නමින් සිංහල මාධ්‍ය රූපවාහිනී මාධ්‍ය ආයතනයක් පිහිටුවන ලදී.

මෙම ආයතනය සඳහා වෙනමම කළමනාකරණ මණ්ඩලයක් පත්කළ අතර, එය ලංකා ගුවන් විදුලි සමාගමෙන් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට ඉඩකඩ ලබා දෙන ලදී. නව කළමනාකරණ මණ්ඩලය යටතේ, ලංකා ටී. වී. සමාගම කටයුතු ආරම්භ කළ අතර, මෙහිදී තම දැක්ම ලෙස ප්‍රමුඛ සන්නිවේදකයා, ප්‍රමුඛ ප්‍රසාංගිකයා සහ ප්‍රමුඛ අධ්‍යාපනිකයා බවට පත්වීම යන්න දක්වන ලදී. (එක් එක් ක්ෂේත්‍රය සඳහා විවිධ රූපවාහිනි වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, ඒවා අතර සාම්ප්‍රධායික නොවන වැඩසටහන් රාශියක් හඳුන්වාදෙන ලදී.) ඒ අනුව, උණුසුම් පුවත්, සෑම පැයකම පුවත්, සජීවී සංගීත ප්‍රසංග, දේශීය හා විදේශීය චිත්‍රපට හා ටෙලිනාට්‍ය, රියැලිටි වැඩසටහන් ආදිය දැක්විය හැකිය. ඉහත වැඩසටහන් නිසා රටේ ජනතාව තුල ලංකා රූපවාහිනී ජාලය, ඉතා ජනප්‍රිය වූ අතර, 2010 වන විට රූපවාහිනි මාධ්‍ය කර්මාන්තයේ, ප්‍රමුඛ ආයතනය බවට පත්වීමට ලංකා රූපවාහිනී සමාගමට හැකිවිය.

කෙසේ වෙතත්, වර්ථමානය වන විට ලංකා සමාගම් සමූහය අභියෝග කීපයකටම මුහුණ දී ඇත. ඉන් ප්‍රමුඛ අභියෝගය වන්නේ, ලංකා ගුවන් විදුලි සමාගම යම් පසුබෑමකට ලක්වීමයි.

විශේෂයෙන් අළුතින් කර්මාන්තයට ඇතුළු වූ සමාගම් කීපයක් නිසා ලංකා ගුවන් විදුලි සමාගම මෙතෙක් ලබාගෙන සිටි තත්ත්වය ක්‍රමයෙන් අඩුවන බව දැකිය හැකිය. මෙම නව සමාගම් ඉතා තරඟකාරී හා නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නිසා, ලංකා ගුවන් විදුලි සමාගමේ, වෙළෙඳපොල කොටස ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. මෙම තත්ත්වය දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුවන් විදුලි නාලිකා සම්බන්ධයෙන් ප්‍රමුඛව දැකිය හැකිය.

මීට අමතරව, ලංකා රූපවාහිනී ජාලය මුහුණදී ඇති අභියෝගය වන්නේ, තම වෙළඳපොල ප්‍රමුඛත්වය ආරක්ෂා කර ගැනීමයි. මෑත කාලයේදී තරඟකාරී අනෙකුත් රූපවාහිනී ආයතන, අනුගමනය කළ උපායමාර්ගයන් හමුවේ තම උපායමාර්ග වල තරඟකාරී හැකියාව අඩු වී ඇත. මේ නිසා ක්‍රමයෙන් කර්මාන්තය තුල තම තරඟකාරී වාසිය අඩුවෙමින් පැවතීම දැකිය හැකිය.

ඉහත තත්ත්වයන්ට මුහුණදීම සඳහා ඉතා ඉක්මණින් ආයතනය තුල උපායමාර්ගයන් විමර්ශනය හා ඇගයීමක් සිදුකළ යුතු බවත්, ඒ අනුව නවතම උපායමාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කළ යුතු බව ඉහළ කළමනාකරණයේ අදහස වී ඇත.

(මෙය මනඃකල්පිත සිද්ධියක් බව සලකන්න.)

**ප්‍රශ්න 01**

ආ) ලංකා මාධ්‍ය සමාගම විසින් මේ දක්වා අනුගමනය කර ඇති විවිධ උපායමාර්ගයන් හඳුනාගෙන, එම උපාය මාර්ගයන් ආයතනයේ සාර්ථකත්වය සඳහා කෙසේ හේතු වී ඇත්දැයි විග්‍රහ කරන්න.

(ලකුණු 14)

ආ) ලංකා මාධ්‍ය සමාගම වර්තමානයේ මුහුණ දී ඇති අභියෝග ජයගැනීම සඳහා සාමාගමට අනුගමනය කළහැකි උපාය මාර්ගයන් හේතු සහිතව යෝජනා කරන්න.

(ලකුණු 14)

(මුළු ලකුණු 28)

**ප්‍රශ්න 02**

අ) උපායයන් (Strategy) යන්න පැහැදිලි කර, උපායයන් හා ප්‍රතිපත්ති (Policy) අතර වන සම්බන්ධතාවය දක්වන්න.

(ලකුණු 09)

ආ) උපායශීලී කළමනාකරණය සඳහා යොදාගත හැකි සුදුසු සංකල්පනාත්මක රාමුවක් විස්තර කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

**ප්‍රශ්න 03**

අ) ඵලදායී මෙහෙවර ප්‍රකාශයක අඩංගු විය යුතු මූලික ලක්ෂණ කෙටියෙන් දක්වන්න.

(ලකුණු 08)

ආ) අභ්‍යන්තර පරිසරය ඇගයීම යටතේ වන ශ්‍රිතාත්මක ඇගයීම යටතේ, අලෙවිකරණ හා බෙදාහැරීමේ ක්ෂේත්‍රය තුල සලකා බැලිය යුතු මූලික ක්ෂේත්‍ර මොනවාද? උදාහරණ සහිතව දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 18)

**ප්‍රශ්න 04**

අ) ආයතනයක් සඳහා උපායන් තෝරාගැනීම සඳහා වන බොස්ටන් උපදේශන ආකෘතිය' කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 09)

ආ) උපාය සම්පාදනයේදී අදාල වන මූලික පියවර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

**ප්‍රශ්න 05**

අ) ස්ථායී (Stability) උපාය මාර්ගයන් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න දක්වා, ස්ථායී උපාය මාර්ගය අනුගමනය කළහැකි විවිධ අවස්ථා පෙන්වා දෙන්න.

(ලකුණු 09)

ආ) ආයතනයක් සම්බන්ධයෙන් වඩා ප්‍රායෝගිකව දැකිය හැකි වන්නේ මිශ්‍ර උපායන් අනුගමනය කිරීමයි. ඉහත ප්‍රකාශය අනුව, ආයතනයක් මිශ්‍ර උපායයන් අනුගමනය කරන විවිධ අවස්ථාවන් විස්තර කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

**ප්‍රශ්න 06**

අ) ආයතනයකට 'සමකේන්ද්‍රිය' හා 'රාශික විවිධාංගීකරණය' (Concentric and Conglomerate Diversification) යොදාගත හැකි අවස්ථා පෙන්වා දෙන්න.

(ලකුණු 09)

ආ) මයිකල් පෝටර්ගේ පොදු උපායයන් කෙටියෙන් විස්තර කර, ඒවා අනුගමනය කළහැකි විවිධාකාරයන් විස්තර කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

**ප්‍රශ්න 07**

අ) උපායන් ක්‍රියාත්මක කිරීමේදි, කාර්ය සාධනය ඇගයීම හා ප්‍රතිදාන සම්බන්ධකර ගත හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 09)

ආ) නිෂ්පාදනය හා මිලදී ගැනීම (Production and purchasing) සම්බන්ධයෙන් ආයතනයන්ට අනුගමනය කළහැකි විවිධ විකල්ප උපායමාර්ග කවරේද? විස්තර කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 18)

**ප්‍රශ්න 08**

පහත සඳහන් මාතෘකා අතුරින් මාතෘකා තුනක් (03) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) උපායයන් විමර්ශනය හා ඇගයීම
Evaluation and Review of Strategies

(ආ) මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග
Human Resource Management Strategies

(ඇ) සංවිධාන ව්‍යුහය හා උපායයන් ක්‍රියාත්මක කිරීම.
Organizational structure and Implementation of strategy

(ඈ) මූල්‍ය උපාය මාර්ග
Financial Strategies

(එකකට ලකුණු 6 බැගින්)
මුළු ලකුණු 18)